# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2018.07.18

කළමනාකරණ සේවා චක්‍රලේඛ: 03/2018

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ප්‍රධානීන් වෙත,

**<u>රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙනි</u>**

රාජ්‍ය අංශයේ කාර්යමණ්ඩල පිළිබඳ 2018 වර්ෂයේ පළමුවන කාර්තුවේ වාර්තාව යන මැයෙන් ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් 2018.06.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

(I). සියලුම අමාත්‍යාංශ හා ඒවායේ විෂය පථය යටතට ගැනෙන ආයතනවල පහත (අ) හා (ආ) හි සඳහන් පරිදි කටයුතු කර ඇති අවස්ථා පවතී නම්, සලකා බැලීම පිණිස, ඒ පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කළයුතු වේ.

(අ). පළාත් සභා ඇතුලු රාජ්‍ය ආයතන විසින් එම ආයතනවල අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විවිධ සේවා කාණ්ඩ යටතේ බඳවාගෙන ඇති සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර;

(ආ). ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවල සේවකයින් වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වැඩි කිරීම පිළිබඳ විස්තර;

(II). ඉදිරියේදී, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා සිය ආයතනවල කාර්යමණ්ඩල වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැළකිය යුතු වන අතර එකී උපදෙස්වලට අනුගතව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් වන වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා/ පළාත් ප්‍රධාන ලේකම්වරයා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අදාළ ආයතනයේ ප්‍රධානියා හා මූල්‍ය අංශයේ ප්‍රධානියා විසින් දැරිය යුතු වේ.

**ආර්.එච්.එස්. සමරතුංග**
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය
04. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
05. ලේකම්, මුදල් කොමිෂන් සභාව
06. සභාපති, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
07. විගණකාධිපති